# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2078/46 – 2018 ජූලි 05 වැනි බ්‍රහස්පතින්දා – 2018.07.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2018 අංක 153 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/2/2018/සීරිබී/180.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය:
ජීඒල්/එල්ඒන්/ඒකිවියූඅයිඑස්/ඒ13/54.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

2018 ජූලි මස 04 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'', අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා.** – ප්‍රාදේශීය ලේකම්, ගලිගමුව.

2. **ඉඩමේ විස්තරය.**– සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, ගලිගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගන් දොළහ පත්තුව සුළු කොට්ඨාසයේ, අංක 75ඒ, වලගම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, බංගලාවත්ත ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක කේජ්/ජීඑල්ජී/2018/114 හා 2018.06.21 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – මුත්තෙට්ටුලන්ද වත්ත – ප්‍රමාණය: හෙක්. 0.1595**
උතුරට: මුත්තෙට්ටුලන්ද වත්ත; නැගෙනහිරට: මාර්ගය (මා.සං.අ.); දකුණට: මාර්ගය (ප්‍රාදේශීය සභා); බටහිරට: මාර්ගය (ප්‍රාදේශීය සභා) සහ මුත්තෙට්ටුලන්ද වත්ත.

07 - 617